# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1974/7 - 2016 ජූලි මස 04 වැනි සඳුදා - 2016.07.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**

3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ වූ නියමය

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ආයෝජන ප්‍රවර්ධන විෂය භාර අමාත්‍යවරයා වන්නා වූ සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය මලික් සමරවික්‍රම වන මා විසින්, 2011 ජූලි 11 වැනි දින අංක 1714/4 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ පළකරනු ලැබූ නියමයට අතිරේකව, මෙම නියමය මගින් පහත දැක්වෙන පරිදි ප්‍රකාශ කර සිටිමි. එනම්,

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රදානය කරන ලද කාලසීමාව දීර්ඝ කිරීමේ අරමුණින් 2011 ජූලි 11 වැනි දින අංක 1714/4 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ නියමයේ (4) වැනි වගන්තිය පහත දැක්වෙන ලෙස කියවෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

> ''(4) දකුණු පළාතේ හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ සුඛෝපභෝගී හෝටලයක් සහ නේවාසික ඒකක සහ/හෝ විලාස් ඉදිකිරීම සඳහා වූ ව්‍යාපෘතිය'' ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ ව්‍යාපෘති සමාගම අතර ව්‍යාපෘති ගිවිසුම අත්සන් කිරීමේ දිනය වූ 2011 පෙබරවාරි මස 07 වැනි දින සිට මාස හැත්තෑවක් (70) කාලසීමාවක් වන 2016.12.31 දින එකී ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු ආරම්භ කළ යුතු බවත් ''

මලික් සමරවික්‍රම,
සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය.

2016 ජූනි මස 24 වැනි දින,
කොළඹ දීය.

07 - 811/1

1A - G 23772 — 12 (2016/07)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත

### 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ වූ නියමය

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ආයෝජන ප්‍රවර්ධන විෂය භාර අමාත්‍යවරයා වන්නා වූ සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය මලික් සමරවික්‍රම වන මා විසින්, 2012 දෙසැම්බර් 19 වැනි දින අංක 1789/22 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ පළකරනු ලැබූ නියමයට අතිරේකව, මෙම නියමය මගින් පහත දැක්වෙන පරිදි ප්‍රකාශ කර සිටිමි. එනම්,

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රදානය කරන ලද කාලසීමාව දීර්ඝ කිරීමේ අරමුණින් 2012 දෙසැම්බර් 19 වැනි දින අංක 1789/22 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළකරනු ලැබූ නියමයේ (4) වැනි වගන්තිය පහත දැක්වෙන ලෙස කියවෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

> ''(4) බස්නාහිර පළාතේ, කොළඹ 03, ගාලුපාර අංක 116 දරන ස්ථානයේ පිහිටි සේවා බද්ධ නිවාස 90 ක් සහිත කාමර 475 කින් අනුයුක්ත නාගරික හෝටලයක් ඉදිකිරීම සහ පවත්වාගෙන යෑම සඳහා වූ, ඉහත කී ව්‍යාපෘතියේ වාණිජ කටයුතු 2012 ජූලි 19 දින ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග අත්සන් කරන ලද ව්‍යාපෘති ගිවිසුම් දිනයේ සිට ආරම්භව 2017 දෙසැම්බර් 31 වැනි දිනයෙන් අවසන් වන මාස හැටපහක (65) කාලයක් තුළ ඇරඹිය යුතු බවත්''

මලික් සමරවික්‍රම,
සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය.

2016 ජුනි මස 24 වැනි දින,
කොළඹ දීය.

07 - 811/2

---

## 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත

### 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ වූ නියමය

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ආයෝජන ප්‍රවර්ධන විෂය භාර අමාත්‍යවරයා වන්නා වූ සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය මලික් සමරවික්‍රම වන මා විසින්, 2012 ඔක්තෝබර් 31 වැනි දින අංක 1782/28 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ පළකරනු ලැබූ නියමයට අතිරේකව, මෙම නියමය මගින් පහත දැක්වෙන පරිදි ප්‍රකාශ කර සිටිමි. එනම්,

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රදානය කරන ලද කාලසීමාව දීර්ඝ කිරීමේ අරමුණින් 2012 ඔක්තෝබර් 31 වැනි දින අංක 1782/28 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළකරනු ලැබූ නියමයේ (4) වැනි වගන්තිය පහත දැක්වෙන ලෙස කියවෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

> ''(4) බස්නාහිර පළාතේ, කොළඹ 01, කොටුවෙහි සුඛෝපභෝගී හෝටලයක් ඇතුලු මිශ්‍ර උපයෝගීතා සංකීර්ණයක් ඉදිකර ක්‍රියාත්මක කිරීම සඳහා වූ ඉහත කී ව්‍යාපෘතියේ වාණිජමය කටයුතු, සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් වශයෙන් මිශ්‍ර උපයෝගීතා ව්‍යාපෘති අනුමැතිය ලැබීමේ දින සිට වූ කාලසීමාවක් ඇතුළත 2021.12.31 දින ආරම්භ කරනු ලැබිය යුතුය.''

මලික් සමරවික්‍රම,
සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය.

2016 ජුලි මස 01 වැනි දින,
කොළඹ දීය.

07 - 811/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.